# ලෝකයේ මුද්‍රණ කර්මාන්තයෙහි ආරම්භය සහ මුද්‍රිත ග්‍රන්ථ ප්‍රකාශනය (යුරෝපය සහ ආසියාව)

**එස්.එම්. තුෂාර නලින්ද සේනානායක**
**තාවකාලික ප්‍රදර්ශක, පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය**
Senanayakethu1990@Gmail.com

**සංක්ෂේපය**

ලෝකයේ විධිමත් ලේඛන කලාවක් අරම්භවනවාත් සමගම එකී ලේඛන සහ අදහස් මුද්‍රණ තාක්‍ෂණය ඔස්සේ ප්‍රකාශයට පත් කරන ලදි. ඒ සඳහා මුල් කාලීනව විවිධ ස්වභාවික දෑ භාවිත කරමින් විවිධ අනන්‍යතා ඔස්සේ මතු පරපුරෙහි දැන ගැනීම පිණිස ආරක්‍ෂා කොට පවත්වාගෙන ගිය ද, 19 වන සියවසේ ආරම්භයත් සමග ඇති වූ කාර්මික විප්ලවයේ ප්‍රතිඵල මත වෙනස් මුහුණුවරක් ගන්නා ලද අතර මුද්‍රණ සහ ප්‍රකාශන කටයුතු සඳහා තාක්‍ෂණික මෙවලම් භාවිත කරමින් මුද්‍රණ කටයුතු සිදු කරන ලදි. එසේම ප්‍රකාශ වශයෙන් යම් යම් නිකුත් කිරීම් සිදු කළ ද, 20 වන සියවසේ මුල් කාලයේ දී පමණ ප්‍රකාශන වශයෙන් ග්‍රන්ථ මුද්‍රණය සිදු කරන ලදි. විශේෂයෙන් යුරෝපයේ ග්‍රන්ථ නිෂ්පාදනය සඳහා ඉතා විධිමත් ප්‍රමිතිගත නිර්ණායක ආරම්භයේ සිටම භාවිත කළ ද ආසියාව තුළ එහි විචල්‍යතාවයක් දැකිය හැකි විය. එයට හේතුව වන්නට ඇත්තේ තාක්‍ෂණික වශයෙන් ආසියාතිකරය දුෂ්කරතා දැක්වීමය. කෙසේ වුවත් නූතනය වන විට යුරෝපයේ මුද්‍රණ සහ ප්‍රකාශන ක්‍රියාවලිය සේම ආසියාව තුළ ද මුද්‍රණ සහ ප්‍රකාශන ක්‍රියාවලිය සාර්ථක අන්දමින් සිදුවීම දැකිය හැක. විශේෂයෙන් මුද්‍රිත ග්‍රන්ථ ප්‍රකාශන කටයුතු විධිමත් අයුරින් ප්‍රකාශ වීම සිදුවිය.

KeyWords : Printing, Publishing, Europe and Asia

**හැඳින්වීම**

මුද්‍රණ ඉතිහාසය ලේඛන සහ භාෂණ ඉතිහාසය තරම් පැරණි වුවක් නොවේ. මානවයා ලේඛනයට හුරුවුයේ අදහස් ප්‍රකාශනයට හුරුවී දීර්ඝ කාලයකට පසුවය. ශිෂ්ට සමාජයක පැවැත්මට ලේඛන කලාවක අවශ්‍යතාවය වැදගත් වේ. මිනිසාගේ සිතුම් පැතුම්, මතක සටහන් තැබීම්, අදහස් ප්‍රකාශ කිරීම්, නව සොයා ගැනීම් සහ සටහන් කර තැබීම් යනාදී දෙයට ලේඛන කලාවක් අවශ්‍ය වන්නාක් මෙන්ම ශිෂ්ටාචාරයේ දියුණුවීම් ඇති වන්නේ ද එවැනි අදහස්, අත්දැකීම් මතු පැවතෙන්නන්ගේ දැන ගැනීම සඳහා ලේඛන ගතකර තැබීමෙනි.

ආදි මිනිසා තමන්ගේ අදහස් සහ මතක තබාගත යුතු දෑ සිහිපත් කර ගැනීම පිණිස ඒවා නොයෙකුත් ආකාරයට සටහන් කරන ලදි. අක්ෂර විද්‍යාව ඇති වීමට පෙර යොදා ගන්නා ලද එවැනි සංඥා ''පික්ටොග්‍රාප්'' (Pictograph), '' අයිඩියොග්‍රාප්'' (Ideograph), සහ ''හයිරොග්‍රාප්'' (Hierograph) වශයෙන් හඳුන්වනු ලැබේ. එම සංඥා වල ඇති ලක්‍ෂණය නම් සංඥා සහ හඳුන්වනු ලබන දැය අතර කිට්ටු සම්බන්ධතාවක් තිබීමයි. (The New Encyclopaedia Britannica, 2010, p.476). එහි ක්‍රමික විකාශනය මුද්‍රණයේ සහ ප්‍රකාශනයේ උච්චතම අවස්ථාව බවට ද පත් විය.

වර්තමානයේදී මුද්‍රණය විෂයක් වශයෙන් හැදෑරෙනවා පමණක් නොව වෘත්තියක් වශයෙන් හා ව්‍යාපාරික සාධකයක් වශයෙන් ක්‍රියාත්මක වේ. එසේම මුද්‍රණය හා තාක්‍ෂණය අවියෝජනීය ලෙස අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතී. එයට හේතුව නම් මුද්‍රණ කාර්ය නියත වශයෙන්ම තාක්‍ෂණය කෙරෙහි රඳා පැවැත්මයි. යට කී ලෙස මුද්‍රණය වෘත්තියක් හා ව්‍යාපාරික සාධකයක්ද වශයෙන් වර්තමානයේදී ක්‍රියාත්මකව පවතින්නේ ද මෙසේ තාක්‍ෂණය හා ප්‍රතිබද්ධව පවතින බැවිනි.

**ලෝකයේ මුද්‍රණ කර්මාන්තයෙහි ආරම්භය**

ක්‍රිස්තු වර්ෂ 1600 වන විට ලෝකයේ බොහෝ රටවල කඩදාසි නිෂ්පාදනය දියුණු මට්ටමක පැවතුණි. කඩදාසි නිෂ්පාදනය කර්මාන්තයක් වශයෙන් ව්‍යාප්ත වීමත් සමඟ මුද්‍රණ ශිල්පය ද, මුද්‍රණ කර්මාන්තය ද වැඩි දියුණු වීම ආරම්භ විය. 17 වන ශතවර්ෂයේ දී කඩදාසි කර්මාන්තය හා මුද්‍රණ කර්මාන්තය ඒකාබද්ධව කැපී පෙනෙන වර්ධනීය තත්ත්වයකට පත්විය. මේ කාලය එළඹෙත් දී ලෝකයේ බලවත් රටවල් දෙකක් ලෙස පිළිගැණුන බ්‍රිතාන්‍යය සහ ඇමෙරිකාව මුද්‍රණ කර්මාන්තයට ප්‍රවිශ්ඨ වී සාර්ථකව මුද්‍රණ කටයුතු කරන ලදි.

මුද්‍රණ ශිල්පය නූතන තාක්‍ෂණික මට්ටම දක්වා වර්ධනය වීම පිළිබඳව ඇත්තේ එතරම් දිගු ඉතිහාසයක් නොවේ. වර්ෂ 1045 පමණ වන විට චීන ජාතික බී ෂෙං (Bi Sheng) පළමු වරට මැටි භාවිතයෙන් එකිනෙකට වෙන් වු අක්ෂර රටාවක් නිර්මාණය කරන ලදි. (කළුආරච්චි, 2004, පි. 16) එහෙත් ඔහු විසින් නිෂ්පාදනය කරන ලද අක්ෂර චීනය තුළ ව්‍යාප්ත නොවීය. ඊට හේතු වුයේ චීන භාෂාව රැපාක්ෂර මත පදනම් වී ඇති බැවින් වෙන වෙන ම නිෂ්පාදනය කළ අක්ෂර භාවිත කරනවාට වඩා ලී බ්ලොක් යොදා මුද්‍රණය කිරීම මුද්‍රණ කරුවන්ට පහසු වු බැවිනි. මෙම කාලය වන විට බෞද්ධ භික්ෂුන් බොහෝ පිරිසක් සිය අතින්ම පොත් පත් පිටපත් කරමින් තම ජීවිතය ඒ වෙනුවෙන් ම කැප කරමින් සිටි බවද මෙහිදී සිහිපත් කළ යුතුය. කෙසේ වුවද පෙරදිග වැසියන් ලී බ්ලොක් ශිල්පය බහුල ලෙස යොදා ගන්නා කාලය වන විට ද යුරෝපීය ජාතීන් පසු වුයේ අතින් පිටපත් කරමින් පොත් නිෂ්පාදනය කරන තත්ත්වයකය.

කෙසේ වුවත් පොත් ලිවීමට හැකි අයුරින් චීන අක්ෂර මාලාවක් බිහි වීම ක්‍රි.පු 22 හා 18 වන ශතවර්ෂය අතර පැවති සියා (Hsia) සහ ක්‍රි.පු 18 හා 11 වන ශතවර්ෂ අතර වු ෂැං (Shang) රාජවංශය දක්වා ඈතට දිවයයි. ක්‍රි.ව 932-953 කාල සීමාවේදී චීන ජාතිකයෝ පෙටෝවෝ (Pen To Vo) රාජ සමයේ කොන්ෆියුසස් ධර්මය මුද්‍රණය කර තබන ලදි. ටැං (Tang) රාජ වංශයේදී ක්‍රි.ව 881 දී පමණ චෙංටු (Chen To) නගරයේ මුද්‍රිත පොත පත විකිණීම සඳහා තිබෙනු දුටු බැව් ලියුං ජිං (Liyun Gin) නම් සංචාරකයාගේ සටහන් වලින් හෙළි කර ඇත. (කළුආරච්චි, 2004, පි. 16)

පෙරදිගින් ඇරඹුණු මෙම මුද්‍රණ ශිල්පය 1300 වර්ෂයේ අග භාගය වන විට යුරෝපය වෙතද සංක්‍රමණය විය. පෙරදිග මුද්‍රණ තාක්‍ෂණය යුරෝපය වෙත ව්‍යාප්ත වීම සඳහා ප්‍රවාහන පහසුකම් දියුණුව නොපැවතීමද ප්‍රබල ලෙස බලපෑ බව පෙනේ. ක්‍රි.ව 1423 දී යුරෝපීයන් විසින් ශාන්ත ක්‍රිස්ටෝපර් (St. Christopher) මුනිඳුන්ගේ රුවක් ලී බ්ලොක් උපයෝගී කොටගෙන මුද්‍රණය කරන ලදි. (පෙරේරා, 1961, පිටු.38) එවැනි මුද්‍රිත පිටපත් එක් කර එකට බැඳ ''මුද්‍රිත පොත් '' නිෂ්පාදනය කිරීම මේ කාලය වන විට යුරෝපයට හුරු පුරුදු විය. ඒ සමඟම පොත් පත් සඳහා අධික ඉල්ලුමක් මතුව ආ බැවින් ලී බ්ලොක් මත හෝ අතින් ලියු පොත් පත් වලින් එම ඉල්ලුම කිසිසේතම සපුරාලිය නොහැකි විය. මෙම ගැටලුවට විසඳුම් ගෙන ආවේ මුද්‍රණ කටයුතු සඳහා තනි තනිව නිෂ්පදනය කෙරුණු අක්ෂර වලිනි.

එහි ගෞරවය හිමි වන්නේ ජර්මන් ජාතික ජොහැන්සන් ගුටන්බර්ග්ටය. (Johann Gensfleisch Zur Laden Zum Gutenburg) ඔහු වර්ෂ 1440 දී පමණ ලෝහ තහඩු වලින් එක් එක් අක්ෂර වෙන වෙනම නිෂ්පාදනය කළ අතර එකල මිදි හා චීස් නිෂ්පාදනයේදී ඒවා පීඩනයට පත් කිරීම සඳහා යොදාගත් යන්ත්‍රයක් මුල්ම මුද්‍රණ යන්ත්‍රය ලෙස ඔහු විසින් වැඩි දියුණු කොට සකස් කරන ලදි. ඒ අනුව ඔහු විසින් සකස් කරනු ලැබු අකුරු මුද්‍රණය කිරීමට අවශ්‍ය අයුරින් සකස් කර අනතුරුව එහි තීන්ත ගල්වන ලදි. පසුව එම අකුරු මත වදින සේ කඩදාසි තබා විසල් ලී පුවරුවක් මඟින් එය පීඩනයට ලක් කිරීමෙන් සිය මුද්‍රණාලයේ මුද්‍රණ කටයුතු සිදු කරන ලදි. මේ ආකාරයට ගුටන්බර්ග්ගේ මුද්‍රණාලයට දිනකට පිටපත් 300 ක් පමණ මුද්‍රණය කිරීමේ හැකියාව පැවත ඇත. වර්ෂ 1450 දී පේළි 42 කින් යුත් සුප්‍රසිද්ධ ''ගුටන්බර්ග් බයිබලය'' (Mazarin Bible) මුද්‍රණය කරන ලදි. මෙම බයිබලයේ පිටුවක කොලම් එකක අකුරු 42 ක් විය. මෙම ග්‍රන්ථයෙන් පිටපත් 200 ක් පමණ ඔවුන් විසින් මුද්‍රණය කරනු ලද බවට සාක්ෂි ලැබී තිබේ. (පෙරේරා, 1961, පි. 48)

17 වන ශත වර්ෂයේ මුල් කාලයේ සිටම මුද්‍රණ කර්මාන්තය සංවර්ධනාත්මක දිශානතීන් දක්වා ගමන් කිරීම යුරෝපයේත් පසු කාලීනව ආසියාවේත් දැකිය හැකිවේ. මෙහි සුවිශේෂී අවස්ථාවක් ලෙස ''සිලින්ඩර'' ආදිය යොදා ගෙන මුද්‍රණ කටයුතු සිදු කිරීම දැක්විය හැක. 1817 මුල් භාගයේ ජර්මන් ජාතික "Freiedrich koleing" විසින් සිලින්ඩර යොදා නිර්මාණය කරන ලද මුද්‍රණ යන්ත්‍ර ආධාරයෙන් මුද්‍රණ කටයුතු සිදු කරන ලදි. එසේම 1844 දී "Richard Hoe" විසින් ඇමරිකා එක්සත් ජනපදය තුළ ප්‍රථම වරට සකස් කිරීමට හැකි මුද්‍රණ යන්ත්‍රයක් සොයා ගන්නා ලදි. මේ සඳහා එක් එක් වර්ගයේ සිලින්ඩර ඔහු භාවිතයට ගෙන ඇත. එලෙසම 1866 දී ලන්ඩනයේදී ''ජෝන් වෝල්ටර්'' (John Walter) විසින් කඩදාසි රෝල් භාවිත කරමින් මුද්‍රණ යන්ත්‍රයක් නිර්මාණය කරන ලදි. (මුද්‍රණ ලෝකය, 1988, පි.7) එය මුද්‍රණ තාක්‍ෂණයේ විශාල පරිවර්ථනයකට තුඩු දුන් සාධකයක් ලෙස පෙන්වා දිය හැක. එසේම ඇමරිකානු ජාතික "Jeptha Wilkinson" විසින් ඡායා පිටපත් 14,000 ක් හා පුවත්පත් නිර්මාණය කළ හැකි මුද්‍රණ යන්ත්‍රයක් නිර්මණය කරන ලදි.

එමඟින් වඩාත් පුළුල් පරාසයක් තුළ මුද්‍රණ කටයුතු කිරීමට අවශ්‍යය පසුබිම මුද්‍රණ කරුවන්ට හිමිව තිබේ. වර්ෂ 1908 දී ජර්මන් ජාතිකයන් දෙදෙනෙකු විසින් කපු කඩදාසි භාවිතයට ගෙන මුද්‍රණ කටයුතු සිදු කරන ලදි. මෙම මුද්‍රණ ක්‍රමය ආර්ථික තත්ත්වය ද පදනම් කොට ගනිමින් සිදුකරන ලද අතර මෙහිදී පිංතූර මුද්‍රණය සඳහා විවිධ වු ගල් වර්ග ප්‍රයෝජනයට ගන්නා ලදි. මේ ආකාරයෙන් 1805 සිට 1904 දක්වා වු කාල වකවානුව තුළදී මුද්‍රණ ලෝකයේ විවිධ වු වෙනස්කම් සිදු වෙමින් සංවර්ධනයට ලක් වී ඇති බව අපට ඒ අවධිය තුළදී දැකගත හැකිවේ.

19 වන ශතවර්ෂයේදී යන්ත්‍ර ආධාරයෙන් තනි තනිව නිවැරදිව මුද්‍රණ කටයුතු ආරම්භ කරන ලද අතර 1822 දී යතුරු ලියනය කිරීම් නැවත සංශෝධනයට ලක් කිරීමද ආරම්භ කර ඇත. මීට අමතරව මෙම කාල වකවානුවේදී පේළි 1400 ත් 6000 ත් අතර විශාල ප්‍රමාණ වලින් යුතු මුද්‍රණයන් ඉදිරිපත් කිරීම ද සුවිශේෂිතා අතර වේ. එලෙසම 1897 දී ඇමරිකා එක්සත් ජනපදයේදී ඉංග්‍රීසි මෙහෙයුම් හා යතුරු ලියන පුවරු භාවිත කිරීම මඟින් විවිධ වු පද්ධති වර්ග භාවිත කොට එකිනෙකට වෙනස් වු මුද්‍රණ වර්ගයන් ඉදිරිපත් කරන ලදි. මින් අනතුරුව පරිගණක හා ක්ෂුද්‍ර සැකසුම් පද්ධති යොදාගෙන එකිනෙකට වෙනස් වු විවිධ වර්ග වල මුද්‍රණයන් සිදු කිරීමට පෙළඹී ඇත. 1976 වර්ෂය තුළදී මේ සමග ලේසර් කිරණ භාවිත කිරීම මඟින් මුද්‍රණය ආරම්භ කර ඇති අතර පෙරට වඩා ඉතා සාර්ථක අන්දමින් මුද්‍රණ කටයුතු මේ අවධිය තුළදී සිදු කරන ලදි. මෙහිදී දැව නිර්මාණ, ජල නිර්මාණ ආදී දෑ ඉතා දක්‍ෂ අන්දමින් පොත් වල ස්වභාවික අන්දමින්ම නිර්මාණය කොට මුද්‍රණය කර ඇත. (මුද්‍රණ ලෝකය, 1988, පි.8)

මින් අනතුරුව කළු සුදු මුද්‍රණයට අමතරව විවිධ වු පාට වර්ග භාවිත කරමින් වර්ණ මුද්‍රණ ඉදිරිපත් කරන ලදි. මෙලෙස මුද්‍රණ යන්ත්‍රයේ තැටි වර්ග උපයෝගී කොටගෙන වර්ණ ඡායාරූප මුද්‍රණය කිරීම ආරම්භ කර ඇත. මේ ආකරයට 1946 සිට 1950 යන කාලවකවානු තුළ මෙම වර්ණ මුද්‍රණය ඉතාම සාර්ථක අන්දමින් සිදු කිරිමට අවශ්‍යය පරිසරය මුද්‍රණ කර්මාන්තය තුළ නිර්මාණය වී ඇත. මේ සඳහා විද්‍යුත් තාක්‍ෂණය ද නිරායාසයෙන්ම මේ සඳහා ලැබී ඇත. 1980 දී පමණ පරිගණක තිර භාවිතයට ගෙන මුද්‍රණ කටයුතු සිදු කොට ප්‍රචාරණයට පත් කරන ලදි. අද වන විට මෙලෙස ක්‍රියාත්මක වු මුද්‍රණ ලෝකය සම්පූර්ණයෙන්ම පාහේ පරිගණකගත කොට පරිගණක ක්‍රියාවක් බවට පත් කොට ඇත්තේය.

## ලෝකයේ මුද්‍රිත ග්‍රන්ථ ප්‍රකාශනය

පාලක මුද්‍රණ ක්‍රමයට මුද්‍රිත ලොව ප්‍රථම මුද්‍රිත ග්‍රන්ථය ලෙස ඉතිහාසගත වී ඇත්තේ වජ්‍ර සූත්‍රයයි. (Diamond Sutra) බෞද්ධ ධරණී සූත්‍රය ද සමකාලීනව පාලක ක්‍රමයට මුද්‍රණය වු කෘතියක් ලෙස සැලකේ. වජ්‍ර සූත්‍රයෙහි පිටුවක් අඟල් 2 2/1 පළල වු අතර අඟල් දොළහක් දික් විය. පොතෙහි අවසානයෙහි එය මුද්‍රණය කරන ලද්දේ ක්‍රි.ව. 868 මැයි එකොළොස් වන දින වොං චී විසින් තම මියගිය දෙගුරුන්ට ගරු කිරීම සිහි කිරීම සඳහා නොමිළයේ මහජනයා අතර මේ පොත් බෙදා දුන් බවද සඳහන් වේ. මෙම ප්‍රථම මුද්‍රිත ග්‍රන්ථය හමු වි ඇත්තේ චීනයේ ටුං හුවාං නගරයෙහි පිහිටි දහසක් බුදුවරුන්ගේ ගල් ගුහාවෙනි. (ලීලරත්න, 2010, පි. 32) පාලක මුද්‍රණ ක්‍රමයට මුද්‍රිත වජ්‍ර සූත්‍රය ලොව ප්‍රථම මුද්‍රිත කෘතිය ලෙස විශ්වකෝෂයන්හි සඳහන් වීම මෙතෙක් එය එසේම

පිළිගැනීමට හේතු වී ඇත. එසේම මුද්‍රණයෙන් නිකුත් කෙරෙන ප්‍රකාශනයක ප්‍රකාශන අයිතිය පිළිබඳ සටහන (Imprint) ආරම්භ වන්නේද වජ්‍ර සූත්‍රයෙනි.

අකුරු ඇමිණීමේ ක්‍රමය ශක්තිමත් තත්ත්වයකට පැමිණ වූ මුද්‍රණ ශිල්පයේ පියා ලෙස ලෝකයේ ප්‍රසිද්ධියට පත් වූ ජොහැන්නස් ගුටෙන්බර්ග් විසින් සොයා ගැනුණු නව මුද්‍රණ ශිල්ප ක්‍රමය මුද්‍රණ ශිල්පයේ ඉතිහාසයේත් වර්තමානයේත් සංධිස්ථානයක් සේ සැලකේ. ගුටෙන්බර්ග් ප්‍රථමයෙන් එක් එක් අකුරු ලීයෙන් කපා ඒවා රාමුවක් තුළ එකට සවි කොට වචන නිර්මාණය කරන ලදි. පසුව අච්චුවක් පිළියෙල කොට එම අච්චුවේ අකුරු හෝ අදාළ සටහන් මත තීන්ත තවරා ඒ මත කඩදාසි තබා කිසියම් පීඩනයක ආධාරයෙන් මුද්‍රණ කාර්ය සිදු කරන ලදි. පසු කලෙක ගුටෙන්බර්ග් අකුරු සඳහා ලෝහ මිශ්‍රණයක් සොයා ගන්නා ලදි. 1456 දී ලෝක ප්‍රකට (''මයින්ස්'' Mains) පේළි 42 කින් යුත් බයිබලය නම් වූ ආගමික ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලදි. එය ලෝක ඉතිහාසයේ ග්‍රන්ථ ප්‍රකාශනයෙහි නව පරිච්ඡේදයක් ආරම්භ කළ අවධියක් සේ සැලකිය හැකිය.

වර්ෂ 1500 පමණ වන විට ආසියාවේ මෙන්ම යුරෝපය පුරා දෙදහසකට අධික මුද්‍රණාල සංඛ්‍යාවක් පැතිර තිබූ අතර ඒවායින් පොත් පත්‍ර ලක්ෂ ගණනින් බිහිවිය. එංගලන්තයේ ප්‍රථම මුද්‍රණාලය ආරම්භ කරන ලද '' විලියම් කැක්ස්ටන් '' (William Caxton) විසින් ඔහුගේ මුද්‍රණාලයෙහි මුද්‍රණය කළ මුල්ම පොත වූයේ ප්‍රශයේ නිෂ්පාදිත ග්‍රන්ථයක පරිවර්තනයක් වූ (Recuylee of the History of Troye) නම් ග්‍රන්ථයයි. (කළුආරච්චි, 2004, පි. 32) 1487 වර්ෂයේදී කැක්ස්ටන් විසින් ලන්ඩන් නුවරදී පොත් සමාගමක් ආරම්භ කරන ලද අතර එය ඉතා ශීඝ්‍රයෙන් ලාභ උපයන ධන මාර්ගයක් බවට පත් විය. පොත් ප්‍රකාශනය පිළිබඳ ප්‍රබල බලය වටහාගත් අටවන හෙන්රි රජු ප්‍රකාශන පල කිරීමට සහ ප්‍රකාශන ආයතන ආරම්භ කිරීම සඳහා රාජකීය අවසරය ලබාගත යුතු බවට නියෝග පනවන ලදි.

වර්ෂ 1539 දී ඉතාලි ජාතික ජුවාන් පැබ්ලෝස් (Juan Pablos) විසින් මැක්සිකෝ නගරයෙහි මුද්‍රණාලයක් පිහිටුවීමත් සමඟම උතුරු ඇමරිකාවටද මුද්‍රණ ශිල්පය ව්‍යාප්ත විය. එහි මුද්‍රණය කළ ප්‍රථම ග්‍රන්ථය වූයේ "Brevey Mass Compendiosa Doctrina Cristian" නම් වූ ආගමික ග්‍රන්ථයයි.

කෙසේ වුවත් ග්‍රන්ථ ප්‍රකාශනය වඩාත් ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ගියේ බ්‍රිතාන්‍යයේය. බ්‍රිතාන්‍යයේ මුල්ම මුද්‍රණාලය වන විලියම් කැක්ස්ටන්ගේ මුද්‍රණාලය ආරම්භ කොට අනතුරුව එය ප්‍රකාශන සමාගමක් දක්වා පුළුල් කරමින් මුද්‍රණ කර්මාන්තය වඩාත් ලාභ ලැබිය හැකි කර්මාන්තයක් බව විලියම් කැක්ස්ටන පෙන්වා දී තිබීම එයට හේතුව වේ. මේ නිසා බ්‍රිතාන්‍යයේ මුද්‍රණ කර්මාන්තය තුළ ග්‍රන්ථ ප්‍රකාශනය වඩාත් යහපත් අයුරින් පවත්වාගෙන යාමටට හැකි පසුබිම නිර්මාණය වෙමින් පැවතුණි. එසේම පාඨක ප්‍රජාවගේ වර්ධනයෙහි ප්‍රවණතාවයක් දක්නට තිබූ හෙයින් මුද්‍රණාල වලට අනුබද්ධිත මහා පරිමාණයේ ප්‍රකාශන සමාගම් බ්‍රිතාන්‍යයේ ප්‍රධාන නගර ආශ්‍රිතව ආරම්භ වීම දක්නට ලැබේ.

මුද්‍රණ කර්මාන්තය නිසා ඇතිවුණු පොත් ප්‍රකාශන සමාගම් වාර්තාගත ලෙස ලාභ ලබමින් ව්‍යාප්ත වීමත් සමඟ මුද්‍රණ ක්ෂේත්‍රයේ නිර්මාණ ශිල්පීහු හා මුද්‍රණකරුවෝ වඩා කාර්යක්ෂම හොඳ තත්ත්වයේ මුද්‍රණ යන්ත්‍ර හා මුද්‍රණ උපකරණ නිපදවීම කෙරෙහි සිය අවධානය යොමු කරන ලදි.

ක්‍රි.ව 1800 පමණ වන විට යුරෝපයේ බොහෝ රටවල මුද්‍රණ කර්මාන්තය ආරම්භ වෙමින් ව්‍යාප්ත වීමට පටන් ගත්තේ එහි ලාභදායී තත්ත්වය පදනම් කොටගෙනය. වාෂ්ප බලයෙන් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීමෙන් මුද්‍රණ කාර්යයට ගතවන කාලය අවම වීමත් පිටපත් විශාල සංඛ්‍යාවක් මුද්‍රණය කරගත හැකි වීමත් නිසා පුවත් පත් ප්‍රකාශනය ද ග්‍රන්ථ ප්‍රකාශනය මෙන්ම වඩාත් ප්‍රචලිතව පැවතුණි. මේ කාලයේ අගභාගය පමණ වන විට විදුලි පණිවුඩ යැවීමද සොයාගෙන තිබූ බැවින් එක්තරා මට්ටමකට තොරතුරු සන්නිවේදනය ආරම්භ වෙමින් පැවතුණි. මේ නිසා ග්‍රන්ථ හා පුවත්පත් අලෙවිය සෙසු ප්‍රදේශ දක්වා ව්‍යාප්ත වීමක් මේ අවධියෙහි දැකිය හැකි අතර එය පසු කාලීනව ආසියාව සහ ලතින් ඇමරිකානු රාජ්‍යයන් දක්වා ව්‍යාප්ත වීමත් දැකිය හැකි වේ.

පසුකාලීනව ලොව ග්‍රන්ථ ප්‍රකාශනයෙහි සංවර්ධනාත්මක කාල පරිච්ඡේදයන් කිහිපයක් පසු කරමින් විකාශනය වීම දැකිය හැකි වේ. එහි වර්ධනය අදවන විට තාක්‍ෂණයෙහි දියුණුවත් සමඟ යම් යම් වෙනස් වීම් හමුවේ පරිවර්තනයකට පත් වෙමින් පවතී.

**සමාලෝචනය**

ලෝකයේ දිනෙන් දින බිහිවන දැනුම අනාගත ප්‍රයෝජනය සඳහා සනිටුහන් කර තබා ගැනීමේ ප්‍රධාන මාධ්‍යයක් ලෙස ග්‍රන්ථ බිහි විය. ඒත් සමඟම දැනුම සැපයීමේ ප්‍රධාන සන්නිවේදන මෙවලමක් ලෙස එහි වටිනාකම ලෝකයාට අවබෝධ වන්නට ද විය. මුල් යුගයේදී පිටපත් කිහිපයකට පමණක් සීමා වූ ලේඛනය, මුද්‍රණ ශිල්පය පැමිණීමත් සමඟ පිටපත් රාශියකින් මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කිරීමට හැකිවීම නිසා වැඩි පාඨක පිරිසකට භාවිත කළ හැකි සුලභ මාධ්‍යයක් බවට පත් විය. ග්‍රන්ථයක වැඩි පිටපත් ප්‍රමාණයක් පහසුවෙන් ලබා ගැනීම සඳහාත් එම පිටපත් පාඨකයන්ට වඩාත් පහසුවෙන් යොමුවන අයුරින් උසස් නිමාවකින් මුද්‍රණය කර ගැනීම සඳහාත්, ශිල්පීය වශයෙන් විවිධ අත්හදා බැලීම් සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ මුද්‍රණ තාක්‍ෂණය පදනම් කරගත් ග්‍රන්ථ ප්‍රකාශනය ආරම්භ විය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

**මුද්‍රිත ග්‍රන්ථ**

Encyclopedia Amaricana. (1960) Amaricana Corporation, United States of America.

Press At Colombo, Royal Asiatic Society.

The New Encyclopedia Britanica. (2010) Vol.9, Encyclopedia Britanica Inc. Chicago.

The Printed Word. (1988) the United Nations Educational, Scientific and Cultural Oraganaization. UNESCO Editorial, Sales and Destrbution Office, Paris.

කළුආරච්චි, සමන්. (2004) ලක්දිව මුද්‍රණ ඉතිහාසය, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.

පෙරේරා, විල්මට් ඒ. (1961) මුද්‍රණ ශිල්පයේ ඉතිහාසය, ඇස්. ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.

ලීලාරත්න, උපාලි. (2010) මුද්‍රණ තාක්‍ෂණය : ගල් අච්චුවේ සිට පරිගණකය දක්වා, ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.

හපුආරච්චි, අජන්තා. (2003) මුද්‍රණ ශිල්පය : ප්‍රභවය හා පරිණාමනය (ශ්‍රී ලංකාවට විශේෂිතව), ගොඩගේ ප්‍රකාශකයෝ, කොළඹ 10.

**සඟරා ලිපි**

Books Publishing Industry in Sri Lanka form 1965 to 1980. N.B.D.C. of Sri Lanka Library News.1982.Jan-Mar., 3(1), 7-9p.